# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 1570/34 - 2008 ඔක්තෝබර් 10 වැනි සිකුරාදා - 2008.10.10

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### ආණ්ඩුවේ නිවේදන

එල්.ඩී.බී. 21/78

1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනත

24අ වගන්තිය යටතේ වූ නියමය

1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනතේ 24අ වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, උසස් අධ්‍යාපන අමාත්‍ය වටරක ආරච්චිලාගේ විශ්වා වර්ණපාල වන මා විසින්, විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විමසා, කොළඹ විශ්ව විද්‍යාලයේ පාලක සභාවේ එකඟත්වය ද ඇතිව මේ නියමය මගින් -

(අ) කෘෂිකර්ම සහ කෘෂි තාක්ෂණයේ සහ කෘෂි තාක්ෂණය සහ ග්‍රාමීය විද්‍යා මූලිකාංග පිළිබඳ උසස් අධ්‍යාපනයේ දැනට යෙදී සිටින තැනැත්තන් සඳහා උසස් අධ්‍යාපනය ලබා දීම, ප්‍රවර්ධනය සහ වර්ධනය කිරීමේ කාර්ය සඳහා ඉහත පනතේ විධිවිධාන යටතේ උසස් අධ්‍යාපන ආයතනයක් 2008.09.19 දින සිට ක්‍රියාත්මක වන පරිදි පිහිටුවමි;

(ආ) එකී ආයතනය කොළඹ විශ්ව විද්‍යාලයට අනුයුක්ත කරමි ; තවද

(ඇ) එකී ආයතනයට "කොළඹ විශ්ව විද්‍යාලයීය - කෘෂි තාක්ෂණික සහ ග්‍රාමීය විද්‍යා ආයතනය" යන නාමය පවරා දෙමි.

මහාචාර්ය වටරක ආරච්චිලාගේ විශ්වා වර්ණපාල,
උසස් අධ්‍යාපන අමාත්‍ය.

2008 සැප්තැම්බර් මස 19 වැනි දින,
කොළඹ දී ය.

10 - 700


1A - G 010320— 940 (2008/10) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.